# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2117/52 - 2019 අප්‍රේල් මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2019.04.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: උදු2/2/10/38.

*ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: L/03J/95/FR/173.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාවය ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශ්‍යතාවයේ විස්තරය:*

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කරඹකැටිය ග්‍රාම නිලධාරි වසම තුළ පිහිටි වින්ච්ෆීල්ඩ්පාර්ක් වත්ත නම් වූ සර්වේ ජනරාල්ගේ අංක මහ 6865 දරණ පිඹුරේ දැක්වෙන හෙක්ටයාර් 14.2860 ක් වූ ඉඩම.

*හිමිකම් කියන අය :*

ඒ. ඩබ්. අයි. අබේගුණසේකර - 52, සුමන නිවස, මැද මහනුවර
ඒ. වී. බී. අබේගුණසේකර - 3/බී/3, ඉහල වෙල, කෙන්ගල්ල
ඒ. ඩබ්. එම්. එම් අබේගුණසේකර - 211/ඒ, අකරවිට, ගම්පහ
ඒ. වී. එස්. අබේගුණසේකර - 21, පරාක්‍රම සමුද්‍රය, පොළොන්නරුව
ඒ. වී. එච්. අබේගුණසේකර - මී ගොල්ල වලව්ව, මියනදෙණිය, පිහිඹුව
ඒ. වී. එල්. අබේගුණසේකර - 10ජී, වාගොල්ල පාර, ලේවැල්ල
ඒ. වී. ඩබ්. අබේගුණසේකර - උඟුරුගල, මැද මහනුවර

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019.05.15 වැනි දින පෙ.ව. 10.00 ට උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2019.05.08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම්/පරවශ්‍යතාවයන්ට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

සුජානී ආර්. විජේතුංග,
ප්‍රාදේශීය ලේකම්,
උඩදුම්බර.

2019 මාර්තු මස 28 වැනි දින,
උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04 - 646


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: රඹු 574 RBK/LAN/AQURE/A3/69.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/7/2016/HW/47.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2018.10.03 දින පළවූ අංක 2019/47 *අති විශෙෂ ගැසට්* පත්‍රයේ III වන කොටසෙහි සඳහන් 2018 ඔක්තෝබර් මස 30 වැනි දින පෙ.ව. 10.00 ට තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය යන්න පහත සඳහන් පරිදි නිවැරදි විය යුතු ය.

2018 ඔක්තෝබර් මස 30 වැනි දින පෙ.ව. 10.00ට රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

ඩබ්. එල්. ආර්. ඉන්දික ලියනගේ,
ප්‍රාදේශීය ලේකම්,
රඹුක්කන.

2019 මාර්තු මස 12 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04 - 647

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.